# පරිසරය

## 5 ශ්‍රේණිය



Start Your Learning Journey with e-thaksalawa

The National e-learning Portal for The General Education



# 15.මිනිසා හා තොරතුරු

## ක්‍රියාකාරකම 25

- අතීතයේ සිට වර්තමානය දක්වා මිනිසා භාවිතා කළ තොරතුරු සන්නිවේදන ක්‍රම සොයා බලන්න. රූප සටහන්, ඡායාරූප හා විස්තර රැස් කර "තොරතුරු සන්නිවේදන ක්‍රම" නමින් පොත් පිංචක් සාදන්න.
- අන්තර්ජාලය භාවිතයේදී වැඩිහිටියෙකුගේ උදව් ලබා ගන්න.

## ක්‍රියාකාරකම 26

- ලෝකය පුරා පොදුවේ යොදා ගන්නා සම්මත සලකුණු සංකේත/සංඥා පිළිබඳව සොයා බලන්න.
- ආහාර ඇසුරුම්, ඖෂධ ඇසුරුම් හා සම්බන්ධ වෙළඳ දැන්වීම් ගුවන් විදුලි, රූපවාහිනී වැනි උපකරණ මිලට ගැනීමේදී දෙනු ලබන උපදෙස් පත්‍රිකා රැස් කර අවධාරණය කර ඇති කරුණු මොනවාදැයි සොයා බලන්න. දැනුවත් වෙන්න.

## ක්‍රියාකාරකම 27

- නිවස අවට ගෙවත්තේ ඇති අනාරක්ෂිත ස්ථාන හඳුනා ගැනීමට කෙටි චාරිකාවක යෙදෙන්න. අනතුරු සහිත ස්ථාන තිබේනම් හඳුනාගන්න. එහි ආරක්ෂාව සඳහා ගත යුතු පියවර විස්තර කෙරෙන පත්‍රිකාවක් නිර්මාණය කරන්න. එය සංකේත හා සංඥා සහිත නිර්මාණයක් බවට පත් කරන්න.

  උදා: පාරේ කැඩීගිය තැන්, පාර අයිනේ ඇති වළවල්, වසා නැති පරණ

  ළිං, ගැඹුරු මඩ වළවල්, දිරා ගිය අතු ඇති ගස්, නිවසට නැඹුරු වී ඇති උස ගස්


Copyright© www.e-thaksalawa.moe.gov.lk